**ධීවර ත්‍යාග අරමුදල - 2022**

**-------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ධීවර ත්‍යාග අරමුදලේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ , විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය  තත්ත්වය  සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා  මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය  ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ  වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ  මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ධීවර ත්‍යාග අරමුදල් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය පිළියෙල කිරීමේ දී ලැබිය යුතු ආදායම් හඳුනාගෙන නොතිබුණු අතර සටහන් අංක 7 අනුව ගිණුම් ප්‍රතිපත්තිය උපචිත පදනම බවට හෙළිදරව් කර තිබුණ ද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය මුදල් පදනම මත පිළියෙල කර තිබුණි. | විගණන නිරීක්ෂණය හා එකඟ වෙමි. ඉදිරියේදී වර්ෂය තුළ ලැබිය යුතු ආදායම් නිවැරදිව හඳුනාගෙන ඉදිරිපත් කරන ලෙස අදාළ නිලධාරීන්ට උපදෙස් දෙන ලදි. | උපචිත පදනම මත මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය පිළියෙල කළ යුතුය. |

### 1.5.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම<br>රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම<br>රු. | වෙනස<br>රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| වැටලීම් සඳහා දායක වූ නිලධාරීන්ට ගෙවිය යුතු දීමනාව | 1,907,760 | 1,043,435 | 864,325 | ගෙවිය යුතු නිලධාරීන් පිළිබඳ ශේෂයන් හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු සිදුකරනු ලැබේ. | ගෙවිය යුතු ශේෂයන් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතු අතර එයට අනුරූපීව උපලේඛණ පිළියෙල කළ යුතුය. |

## 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මුදල් පොතේ පැවති රු.9,848,765 ක්වූ ශේෂයෙන් ත්‍යාග ලෙස ත්‍යාගලාභීන්ට ගෙවිය යුතු මුදල් හා ඊට අදාළව ගෙවිය යුතු රජයේ දායකත්වය පෙන්නුම් කරනු ලැබුව ද ගෙවිය යුතු ලෙස මූල්‍ය ප්‍රකාශනවල පෙන්වා තිබුණු රු.1,907,760 හැර | වැටලීම් සඳහා දායක වූ නිලධාරීන්ට ගෙවිය යුතු මුදල හා ඊට අදාළව ගෙවිය යුතු රජයේ දායකත්වය වන රු.9,848,765.00ක් වූ ශේෂය එක් එක් දිස්ත්‍රික් කාර්යාල | දිස්ත්‍රික් ධීවර කාර්යාල වලින් නිවැරදි තොරතුරු ගෙන්වා ගෙන ගෙවිය යුතු |

| | | |
|---|---|---|
| ඉතිරි මුදල වූ රු.7,941,005ක ශේෂය තුළ මෙතෙක් නිශ්චිතව හඳුනානොගත් ශේෂයන් සහ රාජ්‍යභාගය පවතින අතර එම ශේෂ හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | වලින් තොරතුරු ගෙන්වා ගෙන නිරවුල් කිරීම සඳහා කටයුතු කරමින් පවතී. | ශේෂයන් නිරවුල් කිරීම සඳහා කටයුතු කළ යුතුය. |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 59(2) වගන්තිය | (i) | ත්‍යාග අරමුදලේ පරිපාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා වගකිව යුතු වුවද ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් 2019 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරි සැලසුම්වල ත්‍යාග අරමුදලේ කාර්යයන් වූ නීති විරෝධී ධීවර කටයුතු සම්බන්ධ වැටලීම් සිදුකිරීම හා නඩු පැවරීමේ කටයුතු සඳහා සැලසුම් සකස් කර නොතිබුණි. | දිස්ත්‍රික් ධීවර කාර්යාල හා ප්‍රධාන කාර්යාලයේ විමර්ශන අංශය මගින් සිදුකළ යුතු වැටලීම්, නඩු පැවරීම් හා පරීක්ෂා කිරීම් පිළිබඳව දෙපාර්තමේන්තුවේ වාර්ෂික ක්‍රියාත්මක සැලැස්මේ ඉලක්කයන් ලබා දී ඇත. එම නඩු පැවරීම් වලින් ධීවර ත්‍යාග අරමුදල සඳහා මුදල් බැරවන නඩු ප්‍රමාණය සම්බන්ධව පුරෝකථනය කළ නොහැකි බැවින් ඒ සම්බන්ධව ක්‍රියාකාරී සැලැස්මට ඇතුලත් කළ නොහැක. | පනතට පටහැනිව සිදු කරන නීති විරෝධී ධීවර කටයුතු සම්බන්ධ වැටලීම් සිදුකිරීම හා නඩු පැවරීමේ කටයුතු සඳහා සැලසුම් සකස් කළ යුතුය. |
| | (ii) | වැටලීම්වලට සහභාගී වූ නිලධාරීන්ට ත්‍යාග මුදල් ලබාදීම අප්‍රමාදව කළයුතු වුවත් 2015, 2016, 2017, 2018, 2019, 2020, 2021 හා 2022 වර්ෂවල පිළිවෙලින් නඩු 348, 488, 427, 327, 604, 536 ,692හා 293 ක් ලෙස සිදුකර තිබුණි. 2017,2018 හා 2020 වර්ෂවල දී කිසිදු ත්‍යාග මුදලක් ගෙවා නොතිබුණු අතර 2022 වර්ෂය තුළ නඩු 04 කට අදාළව ගෙවූ දීමනා ප්‍රමාණය රු.10,528,987 ක් හා 2022 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු දීමනා රු.1,907,760 ක් විය. මේ අනුව නිලධාරීන් වෙත ත්‍යාග මුදල් ලබාදීම සඳහා කඩිනම් ක්‍රමවේදයක් සකස් නොකිරීම හේතුවෙන් නීති විරෝධි ධීවර කටයුතු වැටලීම් සඳහා නිලධාරීන් දිරිගැන්වීමක් සිදුනොවන බව නිරීක්ෂණය විය. | 2018 වර්ෂයට පෙර ධීවර ත්‍යාග අරමුදලින් නිළධාරීන් වෙත ත්‍යාග මුදල් ලබාදීමේ ක්‍රමවේදයේ යම් පසු බෑමක් සිදුව ඇත. එම ප්‍රමාදයන් වැලැක්වීම සඳහා 2019 වර්ෂයෙන් පසුව විධිමත් ක්‍රමයකට එම කටයුතු ක්‍රියාත්මක කිරීම තුලින් කඩිනමින් ධීවර ත්‍යාග මුදල් ලබාදීමට කටයුතු කරන අතර දිස්ත්‍රික් ධීවර කාර්යාල වලින් ඉදිරිපත් කරනු ලබන මේ සඳහා අවශ්‍ය ලේඛන වල අඩුපාඩු හේතුවෙන් ගෙවීම් සිදු කිරීම ප්‍රමාද වන අවස්ථා දක්නට ලැබේ. ඒ සම්බන්ධව එම දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරුන් වෙත සිහි කැඳවීම් ලබා දී ඇත. | ත්‍යාග මුදල් ලබාදීම සඳහා කඩිනම් ක්‍රමවේදයක් සකස්කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 3,637,671ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 197,873ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.3,439,798ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රාජසන්තක කළ භාණ්ඩ විකිණීමෙන් ලද ආදායම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | කාර්යසාධන වාර්තාවට අනුව 2022 වර්ෂය තුළ පවරා තිබුණු නඩු සංඛ්‍යාව 293 ක් බව දක්වා තිබුණ ද විමර්ශන අංශය විසින් ඉදිරිපත් කරන ලද වාර්තා අනුව පවරන ලද නඩු සංඛ්‍යාව 303 ක් විය. | 2022 වර්ෂය සඳහා ධීවර ත්‍යාග අරමුදල පිළිබඳව කාර්ය සාධන වාර්තාව සඳහා තොරතුරු ලබා දීමේ දී දිස්ත්‍රික් කාර්යාල වලින් වර්ෂ අවසානයේ ලිඛිතව ලබා ගන්නා ලද තොරතුරු පදනම් කරගෙන සකස් කර ඇති අතර මුළු නඩු සංඛ්‍යාව ගණනය කර ඇත්තේ පරිගණක දත්ත මූලයෙහි (Google sheet) යාවත්කාලීන කර ඇති නඩු සංඛ්‍යාව පදනම් කර ගනිමින්ය. වෙනස්කම් සිදු වී ඇති දිස්ත්‍රික් කාර්යාල වලට 2023 වර්ෂයේදී තොරතුරු ලබා දීමේදී නිවැරිදිව තොරතුරු ලබා දෙන ලෙස උපදෙස් දී ඇත. | නඩු පිළිබඳ නිවැරදි තොරතුරු ලබා ගෙන කාර්යසාධන වාර්තාවට ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) | 2022 වර්ෂය තුළ සියලුම දිස්ත්‍රික් ධීවර කාර්යාල හරහා නඩු 293 ක් පවරා තිබුණද දිස්ත්‍රික් ධීවර කාර්යාල 3 කින් පමණක් රාජසන්තක භාණ්ඩ විකුණුම් ආදායම් ත්‍යාග අරමුදලට බැර වී තිබුණි. දිස්ත්‍රික් ධීවර කාර්යාල 13 කින් ත්‍යාග අරමුදලට ආදායම් ලැබී නොතිබීම සම්බන්ධයෙන් කළමනාකරණය අවධානය යොමු කර නොතිබුණි. | අධිකරණයේ පවරනු ලබන නඩු වල නඩු භාණ්ඩයක් වේ නම් එම නඩු භාණ්ඩ රාජසන්තක කරන ලද අවස්ථාවේදි ඒවා වෙන්දේසි කර ලැබෙන මුදල් ධීවර ත්‍යාග අරමුදලට බැර කරනු ලැබේ. එලෙස 2022 වර්ෂයේ ධිවර කාර්යාල 3කින් පවරන ලද නඩු වල පමණක් රාජසන්තක කරන ලද භාණ්ඩ තිබී ඇත. ඒවා වෙන්දේසි කර එම මුදල් ධීවර ත්‍යාග අරමුදලට බැරකර ඇත. | සියලුම දිස්ත්‍රික් ධීවර කාර්යාලවලින් ත්‍යාග අරමුදලට ආදායම් ලැබී නොතිබීම සම්බන්ධයෙන් කළමනාකරණය අවධානය යොමු කළ යුතුය. |
| (ඇ) | නිම වූ නඩුවල තීන්දු ප්‍රකාරව වැරදිකරුවන් විසින් උසාවිවල තැන්පත් කරන ලද මුදල් දිස්ත්‍රික් ධීවර කාර්යාල දැනුවත් කර කඩිනමින් අරමුදලට ගෙන්වා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ධීවර ත්‍යාග අරමුදල සම්බන්ධයෙන් උසාවි වලින් ඉල්ලීම් සිදු කරනු ලබන්නේ අදාළ නඩුව පවරන ලද දිස්ත්‍රික් වල නිලධාරීන් වන අතර එම බැර කිරීම් සම්බන්ධ තොරතුරු විමර්ශන අංශයට ලබාදිය යුත්තේ එම නිලධාරීන් විසිනි. එලෙස තොරතුරු | නිම වූ නඩුවල තීන්දු ප්‍රකාරව උසාවිවල තැන්පත් කරන ලද මුදල් දිස්ත්‍රික් ධීවර කාර්යාල දැනුවත් කර කඩිනමින් අරමුදලට ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | ලබා දීමේ දී සිදුවූ ප්‍රමාදයන් හේතුවෙන් ගෙවීම් සිදු කිරිමට ප්‍රමාද වීම තොරතුරු නිවැරදිව යාවත්කාලින නොවීම වැනි අඩුපාඩු සිදුව ඇත. එම අඩුපාඩු මගහැර ගැනීම සඳහා නඩුව අවසන් වූ වහාම ධීවර ත්‍යාග අරමුදලේ ගෙවීම් සිදු කිරිම සඳහා අවශ්‍ය ලේඛන විමර්ශන අංශයට යොමු කරන ලෙස සහකාර අධ්‍යක්ෂවරු දැනුවත් කර ඇත. | |
| (ඇ) | ත්‍යාගලාභීන් හඳුනාගැනීම පිණිස, නීති විරෝධි ධීවර කටයුතු සිදුවන විට නාවික හමුදාව විසින් අත් අඩංගුවට ගනු ලබන අවස්ථා ද, ඔත්තු ලැබීම් හරහා මෙහෙයුම් කටයුතු සිදුකරන නිලධාරීන් සහ දිස්ත්‍රික් ධීවර කාර්යාලවල සෝදිසි මෙහෙයුම් කරන නිලධාරීන් ද ලේඛන ගත කළ යුතු වුවත්, එවැනි ලේඛනගත කිරීමක් සිදුකර නොතිබුණු අතර ත්‍යාග පිළිබඳ මහජනතාව දැනුවත් කර නීති විරෝධි වැටලීම් වැඩිකර ගැනීමට කළමනාකරණය ක්‍රියාකර නොතිබුණි. තව ද 1996 අංක 02 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 59(1) වගන්තිය යටතේ මෙම අරමුදල පිහිටුවා ඇත්තේ නීති විරෝධි ධීවර කටයුතු වැටලීම් සඳහා නිලධාරීන් දිරි ගැන්වීමේ අරමුණෙන් වුවද එම අරමුණු ඉටුවන ආකාරයට කටයුතු කර නොතිබුණි. | නීති විරෝධී ධීවර කටයුතු මැඩ පැවැත්වීම සඳහා මෙහෙයුම් සිදු කිරිමේදී එම මෙහෙයුම් වලට සම්බන්ධ නිලධාරින් සම්බන්ධව සිද්ධියෙන් සිද්ධියට අදාළව වෙන වෙනම ගොනු පවත්වාගෙන යනු ලැබේ. එම ගොනුවල එම නීතිමය කටයුතු සඳහා දායකත්වය දැක්වූ සියලු දෙනා පිළිබඳ තොරතුරු ඇතුළත් වේ. එයට අමතරව ලොග් සටහන් මගින් ද මෙහෙයුම් කටයුතු සිදු කරන නිලධාරින් සම්බන්ධව සටහන් කරනු ලැබේ. එයට අමතරව පරිගණක ගත දත්ත මූලයන් (Google sheet) මගින්ද එම තොරතුරු පවත්වාගෙන යාමට 2022 වර්ෂයේ සිට කටයුතු කර ඇත. එසේම නීති විරෝධි ධීවර කටයුතු සම්බන්ධයෙන් සිදුකරන සියලු වැටලීම් සම්බන්ධයෙන් ලේඛනයක් නඩත්තු කරන ලෙස විමර්ශන අංශයට උපදෙස් ලබාදෙන ලදි. | ත්‍යාග පිළිබඳ මහජනතාව දැනුවත් කර මතස්‍ය සම්පත ආරක්ෂා කර ගැනීමට හා රජයේ ආදායම වැඩි කර ගැනීම සඳහා නීති විරෝධි වැටලීම් වැඩිකර ගැනීමට කළමනාකරණය ක්‍රියා කළ යුතුය. |

## 3.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | දිස්ත්‍රික් ධීවර කාර්යාල විසින් 2022 වර්ෂයේදී සිදුකළ වැටලීම්වලට අදාළව පවරා තිබුණු නඩු සම්බන්ධව සිදුකළ නියැදි පරීක්ෂාවේදී විමර්ශන අංශය හා ධීවර දිස්ත්‍රික් කාර්යාල 09 ක් ගොනුකළ නඩු 212 ක් ලෙස දක්වා තිබුණ ද, කාර්යසාධන වාර්තාවට අනුව නඩු 127 ක් පිළිබඳ විස්තර කිසිවක් සඳහන් කර නොතිබුණි. | වාර්තා දෙක සඳහා නඩු ප්‍රමාණය ගණනය කිරීමේදී සිදුව ඇති දෝෂයක් හේතුවෙන් මෙම වෙනස ඇති වී තිබේ. ඉදිරියේදී නිවැරදිව අදාළ දත්ත ලබාදෙන ලෙසට නිලධාරීන් වෙත උපදෙස් ලබාදී ඇත. | කාර්යසාධන වාර්තාවට නිවැරදිව තොරතුරු ඇතුළත් කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2022 වර්ෂයට පෙර වර්ෂවල සිට ක්‍රියාත්මක වන නඩු පිළිබඳ විස්තර 2022 වර්ෂයේ කාර්යසාධන වාර්තාවේ ඇතුළත් කර නොතිබුණි. දිස්ත්‍රික් ධීවර කාර්යාල විසින් පවරා තිබූ නඩු, ක්‍රියාත්මක නඩු, ඒ ඒ කාර්යාලවල අත්අඩංගුවේ පවතින භාණ්ඩ, අවසන් වූ නඩුවලින් ත්‍යාග අරමුදලට ලැබිය යුතු මුදල් පිළිබඳ තොරතුරු යාවත්කාලීනව ප්‍රධාන කාර්යාලයේ විමර්ශන අංශය විසින් පවත්වාගෙන ගොස් නොතිබුණු බැවින් ධීවර ත්‍යාග අරමුදලේ කාර්යසාධන වාර්තාවේ ඉදිරිපත් කර ඇති නඩු පිළිබඳ තොරතුරුවල නිවැරදිතාවය තහවුරු කර ගැනීමට නොහැකි විය. | පෙර වර්ෂවල සිට ක්‍රියාත්මක වන නඩුවල තොරතුරු අදාළ නඩු ගොනුවේ යාවත්කාලීන කරන අතර කාර්ය සාධන වාර්තාවට එම තොරතුරු ඇතුලත් කර නොමැත. මෙම වසරේ සිට එම තොරතුරු එක් වාර්තාවක යාවත්කාලීන කර කාර්ය සාධන වාර්තාවට ඇතුලත් කිරීමට උපදෙස් ලබාදෙන ලදි. | කාර්යසාධන වාර්තාව නිවැරදිව පිළියෙල කළ යුතුය. |